**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2022-11-22

පැමිණිලි පාර්ශවය : කේ.ජී.එම්. මෙත්සරණි මෙනෙවිය,
නො 41, ගුණතිලක මාවත,
පානදුර.

වගඋත්තර පාර්ශවය : 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02 උපාලි අමරතුංග මයා
සභාපති, පාසල් ක්‍රීඩා සභාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03 අනුර අබේවික්‍රම මයා ඇතුළු අනෙකුත් කමිටු සාමාජිකයින්
තේරීම් කමිටුව (ක්‍රීඩා අංශය)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/2505/16**

**පැමිණිලි පාර්ශවයේ කරුණු සැළ කිරීම =:**

උක්ත පැමිණිලිකාරිය විසින් 2016-06-29 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සිය ලිඛිත පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, 2016-06-10 දින පැවති 2015 ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා වර්ණ ප්‍රධාන උත්සවයේදී තමාට හිමි වියයුතු දක්ෂතම ක්‍රීඩිකාවට හිමි සම්මානය පැවති නිර්නායක වලට පටහැනිව වෙනත් ක්‍රීඩිකාවකට ලබාදීම සහ දක්ෂතම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல்: sechrcsl@gmail.com

නැගීඑන ක්‍රීඩිකාවට හිමි සම්මානයට ද තමා නිර්දේශ නොකරමින් වෙනත් තමාට වඩා අඩු සුදුසුකම් සහිත ක්‍රීඩිකාවක නම් කිරීම මගින් තමාට හිමි වියයුතුව තිබූ ඉහත අවස්ථා දෙකම අඩු සුදුසුකම් සහිත ක්‍රීඩිකාවන් දෙදෙනෙකුට ලබා දීම මගින් ඉහත වගඋත්තරකරුවන් විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කරදී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවයි. එබැවින් තමාට හිමිවියයුතු ඉහත සම්මාන ලබා ගැනීම සහ නීතියට පටහැනිව කටයුතු කල ඉහත අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනයකින් පසුව තීරණය කරන වන්දියක් හෝ වෙනත් සහන තම පැමිණිල්ල මගින් අපේක්ෂා කරනු ලබන බව ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් =:

ඉහත පැමිණිල්ලට අදාළව 2016-09-27 දාතමින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීමට අනුව සඳහන් කර ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශය වාර්ෂිකව සංවිධානය කරනු ලබන වර්ණ ප්‍රධාන උත්සවය සැලසුම් කරනු ලබනුයේ අමාත්‍යාංශයේ ලියාපදිංචි ක්‍රීඩා සංගම් නිලධාරීන් දැනුවත් කර වර්ණ ලබා ගැනීමට හිමිකම් සහිත සිසු සිසුවියන්ගේ නාම ලේඛන ගෙන්වා ගැනීමෙන් බවත්, ඒ අනුව වර්ණ ලබා ගැනීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පාසල් ස්කොෂ් සංගමය මගින් වර්ණ ලබා ගැනීම සඳහා සුදුසුකම් පිරික්සීමට නාම යෝජනා ඉදිරිපත් කර තිබූ බවත්, අදාළ වර්ෂයේ දැක්වූ ක්‍රීඩා දක්ෂතා මත දක්ෂතම ක්‍රීඩකයා ක්‍රීඩිකාව මෙන්ම වසරේ නැගී එන ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාව තේරීම සිදු කරනු ලබන අතර, එක් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට ඉහත දෙඅංශයෙන් එක් අංශයකට පමණක් ඉල්ලුම් කලහැකි බවත්ය. ඒ අනුව එක් එක් ක්‍රීඩාවට අදාළ වර්ණලාභීන් තේරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වසරේ දක්ෂතම ක්‍රීඩිකාව සහ නැගීඑන දක්ෂතම ක්‍රීඩිකාව තෝරා ගනු ලබන බවත්, පාසල් ක්‍රීඩා සංගම් මගින් නම් කර එවා තිබූ එක් එක් අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ සහතික අනුව 2015 වර්ෂයේ දක්ෂතම ක්‍රීඩිකාව වශයෙන් මලල ක්‍රීඩා යටතේ දක්ෂතා පෙන්වා තිබූ ආර්.එම් රුමේෂිකා රත්නායක ශිෂ්‍යාවද (ඇය මුළු ලකුණු 150 ක් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ඇත) නැගී එන ක්‍රීඩිකාව වශයෙන් චෙස් ක්‍රීඩාව යටතේ දසුනි හංසිකා මෙන්ඩිස් නමැති ලකුණු 113 ක් ලබා තිබූ ශිෂ්‍යාවද තෝරා ගෙන තිබූ බවත්, තේරීම් මණ්ඩලයේ අවසන් වාර්තාව ද ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරිය වන මිහිලියා මෙත්සරණි ශිෂ්‍යාව ස්කෝෂ් ක්‍රීඩාව සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ දිනයේ ඇය විසින් ඉදිරිපත් කරන ලද සහතික පත් සහ පොලිස් නිලධාරියෙකු වන ඇයගේ පියා විසින් ඉන් පසු දිනවල පොලිස් නිල ඇඳුමෙන් පැමිණ වරින් වර ලබාදී ඇති සහතික ආදිය පරීක්ෂා කර බලමින් ලකුණු ලබාදීම සිදු කර ඇති අතර, දක්ෂතම ක්‍රීඩිකාව තේරීම යටතේ ඇය

ලබා ගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 132 ක් බව ප්‍රකාශ කර ඇත. ඉහත සඳහන් කර ඇති පරිදි දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ඇයට වඩා ලකුණු 18 ක් ලබා ඇති රුමේෂිකා රත්නායක ක්‍රීඩිකාව තෝරා ගෙන ඇති බවත්, එකම වර්ෂයකදී දක්ෂතම ක්‍රීඩිකාව සහ නැගී එන ක්‍රීඩිකාව යන අංශ දෙක යටතේම එක් ක්‍රීඩිකාවකට අයදුම් කිරීමට හැකියාවක් නොමැති බවත්, ඒ මත අයදුම්පත් දෙකක් ඉදිරිපත් කර තිබූ මිහිරියා මෙත්සරණි ශිෂ්‍යාව නැගී එන ක්‍රීඩිකාව සඳහා සම්මාන පිරිනැමීමේදී සලකා බැලීමට හැකියාවක් නොවූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ එහි ක්‍රීඩා අංශ නිලධාරීන් කටයුතු කර නොමැති බව වැඩබලන අධ්‍යක්ෂ අමරතුංග මහතා වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**විමර්ශනය =:**

මෙම පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනය සඳහා අවස්ථා කිහිපයකදී පාර්ශවකරුවන් කැඳවා ඇති අතර, 2017.05.25 දින කැඳවා ඇති පරීක්ෂණයට පැමිණිලිකාරිය සහ වගඋත්තරකරුවන් වෙනුවෙන් අධ්‍යක්ෂ (සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) සහභාගී වී ඇති අතර, එම පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවය විසින් තම මුල් පැමිණිල්ල හා ඒ සමග ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන ආශ්‍රයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2015 පාසල් ක්‍රීඩා වර්ණ ප්‍රධානෝත්සවයේදී තමන්ට හිමිවිය යුතුව තිබූ දක්ෂතම ක්‍රීඩිකාවට හිමි සම්මානය ලබා නොදෙමින් පක්ෂපාතීත්වය මත එම සම්මානය වෙනත් ක්‍රීඩිකාවකට ලබාදී ඇති බව සහ නැගීඑන ක්‍රීඩිකාවට හිමි සම්මානය සඳහා තමාව නිර්දේශ නොකිරීම මගින් පැමිණිල්ලේ සඳහන් වගඋත්තරකරුවන් තම මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව අදාළ පරීක්ෂණයේදී පැමිණිලිකාරිය වැඩිදුරටත් ඉල්ලා ඇත්තේ, 2016 වර්ෂයේ පවත්වන පාසල් වර්ණ ප්‍රධානෝත්සවයේදී තමන්ට සිදුව ඇති අගතිය පිළිබඳව සලකා බලා සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන ලෙසයි.

ඒ අනුව පරීක්ෂණ නිලධාරී විසින් පැමිණිලි පාර්ශවය පැමිණිල්ලට අදාළව ඒ වනවිට ඉදිරිපත් කර තිබූ ලිඛිත සහ වාචික කරුණු අනුව පැමිණිලිකාරිය වෙත මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව සහනයක් සලසා දීමට ඇති හැකියාව සම්බන්ධව තවදුරටත් කරුණු සලකා බලන ලෙස වගඋත්තරකාර පාර්ශවය වෙත උපදෙස් ලබා දී ඇත. ඊට වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රතිචාරය වී ඇත්තේ, ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් සමග සාකච්ඡා කර කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් සිදු කරන බවද දන්වා ඇත.

එදින පරීක්ෂණය සඳහා සහභාගී වී ඇති අධ්‍යක්ෂ (සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ) විසින් සිය කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිල්ලට අදාලව ඊට පෙර කොමිෂන් සභාව වෙත විධිමත් ලිඛිත කරුණු දැක්වීමක් සිදු කර ඇති බව සහ ඒ අනුව පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් තමා හෝ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් කටයුතු කර නොමැති බවයි.

2017.03.08 දිනැතිව පැමිණිලි පාර්ශවය විසින් වගඋත්තරකාර පාර්ශවය විසින් ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම සම්බන්ධව තම නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව 2015.03.01 දිනැති ලිපියේ පාසල් වර්ණ පිරිනැමීම සඳහා අදාල පොදු කොන්දේසි ඇතුළත් වන නමුත් වර්ෂයේ දක්ෂතම ක්‍රීඩිකාව සහ නැගීඑන ක්‍රීඩිකාව යන දෙඅංශයෙන් එක් අංශයකට පමණක් ඉල්ලුම් කළහැකි බව කොන්දේසියක් ලෙස එම ලිපියේ ඇතුළත්ව නොමැති බව පෙන්වා දී ඇත. තවද එම කොන්දේසිය පසුව ඉදිරිපත් කර ඇති කොන්දේසියක් බවත්, පැමිණිලි පාර්ශවය රුමේෂිකා රත්නායක ක්‍රීඩිකාවට ලකුණු පිරිනැමීමේදී 20, 10, 10 වශයෙන් ලකුණු 40 ක් පිරිනමා ඇති බවත්, දකුණු ආසියානු ක්‍රීඩා උළෙල 2016.02.05 දින සිට 2016.02.16 දින දක්වා ඉන්දියාවේදී පවත්වා ඇති අතර, එම වර්ණ ප්‍රධානය සඳහා 2015 වර්ෂයේ පැවති තරග පමණක් සලකා බලා ඇති අතර, ඒ අනුව 2016 වර්ෂයේ පවත්වා ඇති තරග සඳහා රුමේෂිකා රත්නායකට ලකුණු ලබාදීම සාධාරණ නොවන බවත්, ඒ අනුව ඇයට ලබාදී ඇති මුළු ලකුණු 150 න් ලකුණු 40 ක් අඩු කර ඇයගේ ලකුණු සංඛ්‍යාව 110 ලෙස නිවැරදි වියයුතු බව සහ තමාට ලබාදී ඇති ලකුණු සංඛ්‍යාව වන ලකුණු 132 සලකා බලන විට රුමේෂිකා යන අයදුම්කාරියට වඩා තමා ලකුණු 22 ක් ඉදිරියෙන් සිටින බවත් පැමිණිලිකාරිය පවසා ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී දෙපාර්ශවය ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු සැලකිල්ලට ගැනීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් පරීක්ෂණ අවස්ථා කිහිපයකටම හේතු නොදන්වා සහභාගී වී නොමැති අතර, අවසන් වශයෙන් 2017.05.25 දින කැඳවා තිබූ පරීක්ෂණයටද කැඳවා තිබූ වගඋත්තරකරුවන් අතරින් එක් අයෙකු පමණක් සහභාගී වී ඇත. එහිදී පැමිණිලි පාර්ශවය විසින් තම පැමිණිල්ලේ කරුණු සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වැඩිමනත් කරුණු දැක්වීම් සම්බන්ධයෙන් ප්‍රතිඋත්තර ලබාදීමට පරීක්ෂණයට සහභාගී වූ උපාලි අමරතුංග මහතා සමත්ව නොමැති බව නිරීක්ෂණය වේ. තවද පැමිණිලි පාර්ශවය සඳහන් කරන ආකාරයට වගඋත්තරකාර පාර්ශවය විසින් 'සියලුම පාසල් ක්‍රීඩා සංගම්' වෙත ලේකම්, ක්‍රීඩා සභාව ලෙස උපාලි අමරතුංග මහතා විසින් අත්සන් තබා ඇති ලිපියේ වර්ණ පිරිනැමීමේදී අදාල පොදු කොන්දේසි වල එක් ක්‍රීඩිකාවකට දක්ෂතම ක්‍රීඩිකාව සහ

නැගීඑන ක්‍රීඩිකාව යන අංශ දෙකටම ඉදිරිපත් විය නොහැකි බවට ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රශ්න සහගත බව නිරීක්ෂණය වේ. කොන්දේසි 6 ක් ඇතුලත්ව ඇති එම ලිපියේ එවැනි කොන්දේසියක් ඇතුලත්ව නොමැති බව නිරීක්ෂණය වන අතර, උපාලි අමරතුංග මහතාගේ අත්සනට පහලින් 'සැලකිය යුතුයි' යන පසු සටහනේ එවැනි කාරණයක් සඳහන්ව ඇති බව නිරීක්ෂණය වේ. තවද එම ලිපියේ වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) අධ්‍යාපන අමාත්‍යංශය, උපාලි අමරතුංග මහතා විසින් අත්සන් තබා ඇති මුල් පිටපත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාලව කටයුතු කර ඇති ආකාරය විනිවිදභාවයෙන් තොරව සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය =:**

ඉහත නිරීක්ෂණ අනුව පැමිණිලිකාරිය වෙත 2015 වසරේ ඇය විසින් එම වසර තුළ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ස්කොෂ් ක්‍රීඩාව මගින් පෙන්වා ඇති දක්ෂතා සහ ලබා ඇති ජයග්‍රහණ සඳහා පාසල් වර්ණ ප්‍රධානය සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී නිසි ඇගයීමක් සිදුවී නොමැති අතර. පැමිණිලිකාරිය විසින් ලිඛිත සාක්ෂි මගින් පෙන්වා දී ඇති පරිදි ඇයට වඩා අඩු දක්ෂතා පෙන්වා ඇති ක්‍රීඩිකාවකට එම වසරේ දක්ෂතම ක්‍රීඩිකාවට හිමි සම්මානය ලබාදී ඇති බව පෙනී යන අතර, නැගී එන ක්‍රීඩිකාවට හිමි සම්මානයටද පැමිණිලිකාරිය නිර්දේශ නොවීම මගින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

මේ වනවිට අදාල සම්මාන පිරිනැමීම සිදු කර අවසන්ව තිබීම මත පැමිණිලිකාරියට සහනයක් සලසා දීම සම්බන්ධව බාධාවක් පවතින බව පෙනී යයි. කෙසේ වෙතත්, විශේෂයෙන් පාසල් වර්ණ පිරිනැමීමේදී එම කටයුතු වඩා විනිවිද භාවයකින් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අධෛර්යයට පත් නොවන ආකාරයෙන් සිදු කළයුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ඇතුළු වගඋත්තරකාර ක්‍රීඩා බලධාරීන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

2022.12.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) ,
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/-